**ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව**

இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு

**HUMAN RIGHTS COMMISSION OF SRI LANKA**


| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2022-01-21 (12) |

පැමිණිලි පාර්ශවය : ජී.අමිල ශ්‍රීකාන්ත මයා,
සෝලම,
තඹුත්තේගම.

ජී.අජිත් විමලසේන මයා - අගතියට පත් අය

වගඋත්තර පාර්ශවය :

01. පොලිස් පරීක්ෂක ඒ.එම්.යූ.ආර්.ජයතිස්ස මයා,
කොට්ඨාශ දූෂණ විමර්ශන අංශය
නියෝජ්‍ය පොලිස්පති කාර්යාලය,
අනුරාධපුර.

02. පොලිස් කොස්තාපල් 28138 ඒ.එම්.ආනන්ද ප්‍රේමසිරි මයා,
පොලිස් ස්ථානය,
නොච්චියාගම.

03. පොලිස් කොස්තාපල් 15901ඩී.එම්.ඒ.එල්.දිසානායක මයා,
පොලිස් ස්ථානය,
මන්නාරම.

04. පොලිස් කොස්තාපල් 64992ඩී.එස්.එරංග ධනපාල මයා,
පොලිස් ස්ථානය,
තඹුත්තේගම.

05. පොලිස් කොස්තාපල් 35889 ඩී.ඩී.ඩී.ධර්මදාස මයා,
මූලස්ථාන පොලීසිය,
අනුරාධපුර.

06. පොලිස් කොස්තාපල් 34659 ඩී.ඩී.එස්.කුමාරසිංහ මයා,
මූලස්ථාන පොලීසිය,
අනුරාධපුර.




ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R.A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541/ 74
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrcsl@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone: 94 -11-2505580 / 81 / 82
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

07. පොලිස් කොස්තාපල් 53585කේ.ජී.ආර්.එච්.සේනාරත්න මයා,
පොලිස් ස්ථානය,
මිහින්තලය.

08. පොලිස් කොස්තාපල් 16127 කේ.එස්.පොඩි කුමාර මයා,
පොලිස් ස්ථානය,
එප්පාවල.

09. පොලිස් කොස්තාපල් 48496 ඩී.එම්.පී.ජ්.දිසානායක මයා,
පොලිස් මූලස්ථානය,
අනුරාධපුර.

10. කාන්තා පොලිස් කොස්තාපල් 1588 ඩී.එම්.ආර්.දිසානායක මයා,
පොලිස් ස්ථානය,
මිහින්තලය.

පැමිණිලි අංකය : **HRC/AP/408/2014(I)**

**පැමිණිල්ල :-**

ඉහත පැමිණිලිකරු විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කරමින් සඳහන් කර ඇත්තේ, 2014.07.05 වන දින පොලිස් මත්ද්‍රව්‍ය නාශක අංශයේ නිලධාරීන් කණ්ඩායමක් පැමිණ ප්‍රධාන පාරේදී අරක්කු බෝතලයක් සමඟ එච්.කරුණාපාල යන අය අත්අඩංගුවට ගත් බවත්, පසුව ජී.අජිත් විමලසේන වන තම සහෝදරයාගෙන් තොරතුරු දැන ගැනීම සඳහා ඔහුව පොලිස් නිලධාරීන් රැගෙන ගිය බවත්, පසුව ඔහුගෙන් නීතිවිරෝධී මත්පැන් පිළිබඳව විමසා ඇති අතර, ඔහු ඒ පිළිබඳව නොදන්නා බව පැවසූ පසු පොලිස් නිලධාරීන් තම සහෝදරයාට අමානුෂික ලෙස පහරදී ඇති බවත්ය. පසුව පොලීසියට රැගෙන ගොස් නීතිවිරෝධී මත්පැන් ළඟ තබා ගත් බව පවසා ඔහුගෙන් ප්‍රකාශයක් ලබාගෙන ගරු අධිකරණය වෙත ව්‍යාජ කරුණු ඉදිරිපත් කර ඇති බවත්, එමගින් අසාධාරණයක් සිදුකර ඇති බවත් දක්වා ඇත.

**අතෘප්තියට පත් අයගේ ප්‍රකාශය :-**

අතෘප්තියට පත් ජී.අජිත් විමලසේන යන අය විසින් දන්වා ඇත්තේ, 2014.07.05 වන දින පොලිස් මත්ද්‍රව්‍ය නාශක අංශයේ නිලධාරීන් පිරිසක් පැමිණ ඒ වන විට සෝලම කඩපොළ ඉදිරිපිට සිටි තමා වෙත පැමිණ තමාගේ අතින් අල්ලා තමන් කවුද යන්න විමසූ බවත්, එසේ විමසා අරක්කු පෙරන තැන් පෙන්වන ලෙසට තමන්ට පැවසූ බවත්, ඒ පිළිබඳව නොදන්නා බව පැවසූ පසු තමන්ව රැගෙන ගොස් තම අත්දෙකට මාංචු දමා බොරළුවලට

රැගෙන ගොස් පොලුවලින් පහර දුන් බවත්, පසුව පොලිසියට රැගෙනවිත් ව්‍යාජ නඩුවක් පවරා අසාධාරණයක් සිදු කරන ලද බවත්ය.

**වගඋත්තරකරුවන්ගේ ප්‍රකාශ :-**

පැමිණිල්ල සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කරමින් වගඋත්තරකරුවන් සඳහන් කර ඇත්තේ, අජිත් විමලසේන යන අය සම්බන්ධයෙන් තොරතුරක් පොලිස් නිලධාරීන් වෙත ලද බවත්, එම තොරතුරේ සඳහන් කරුණු පරීක්ෂා කිරීම සඳහා අදාළ ස්ථානය වෙත 2014.07.05 වන දින ගිය බවත්, එහිදී අජිත් විමලසේන සන්තකයේ නීතිවිරෝධී මත්පැන් තිබියදී අදාළ වරද කියාදී පැය 14.20 ට අත්අඩංගුවට ගත් බවත්ය. පසුව පොලිස් ස්ථානය වෙත රැගෙන ඒමෙන් පසු 2014.07.06 දින පැය 11.50 ට පොලිස් ඇප මත මුදාහරින ලද බවත්, අංක 23423 යටතේ මෙම අයට විරුද්ධව නීතිවිරෝධී මත්පැන් ළඟ තබා ගැනීම සම්බන්ධයෙන් ගරු අධිකරණය වෙත කරුණු වාර්තා කර ඇති බවත් දක්වා ඇත. පැමිණිලිකරු විසින් කර ඇති පහරදීමේ චෝදනාව වගඋත්තරකරුවන් තරයේ ප්‍රතික්ෂේප කරන බවද දක්වා ඇත.

**කොමිෂන් සභාවේ විමර්ශනය හා නිරීක්ෂණ :-**

2014.07.05 දින පැය 14.20 ට නීතිවිරෝධී මත්පැන් ළඟ තබා ගැනීමේ චෝදනාව සම්බන්ධයෙන් පැමිණිලිකාර අජිත් විමලසේන අත්අඩංගුවට ගෙන ඇති අතර, පසුව ප්‍රකාශ සටහන් කර ගෙන ඇති බවත් ගරු අධිකරණයේ පෙනී සිටින ලෙස උපදෙස් ලබා දී 2014.07.06 වන දින පැය 11.50 ට පැමිණිලිකරුව පොලිස් ඇප මත මුදාහැර ඇති බවත් නිරීක්ෂණය වේ.

නඩුබඩු, අංක 117/2014 යටතේ ලේඛන ගත කර ඇති අතර, නීතිවිරෝධී මත්පැන් බෝතල් 20 ක් ළඟ තබා ගැනීමේ චෝදනාවට පැමිණිලිකරුට විරුද්ධව අංක 23423 යටතේ ගරු අධිකරණයට කරුණු වාර්තා කර ඇති බව නිරීක්ෂණය වේ.

එසේම අධිකරණ වෛද්‍ය පරීක්ෂණ පෝරමයක් මඟින් අජිත් විමලසේන යන අයව වෛද්‍යවරයෙකු වෙත ඉදිරිපත් කර ඇති අතර, පැමිණිලිකරුට අදාළ අංක 242/14 දරණ අධිකරණ වෛද්‍ය වාර්තාව ලැබී ඇත.

2014.07.03 දින මෙම පැමිණිලිකාර ජී.අජිත් විමලසේන යන අයට එරෙහිව පහරදීමක් සම්බන්ධයෙන් තඹුත්තේගම පොලීසිය වෙත පැමිණිල්ලක් ලැබී ඇති අතර, එම පැමිණිල්ලට අනුව මෙම අයව ඇප දීමෙන් පසු එදිනම එනම්, 2014.07.06 වන දිනම නැවත පැය 13.05 ට අත්අඩංගුවට ගෙන ඇති බව නිරීක්ෂණය වේ.

**නිරීක්ෂණ හේතු පාය :-**

පැමිණිලිකරු ප්‍රධාන කොටම ප්‍රකාශ කර ඇත්තේ, වගඋත්තරකරුවන් විසින් තම සන්තකයේ නීතිවිරෝධී කිසිවක් නොතිබියදී තමන් අත්අඩංගුවට ගෙන පහරදීමක් සිදු කර ගරු අධිකරණයට ව්‍යාජ කරුණු ගොනු කරමින් අසාධාරණයක් සිදු කරන ලද බවයි.

වගඋත්තරකරුවන් ප්‍රකාශ කර ඇත්තේ, පැමිණිලිකරු නීතිවිරෝධී මත්පැන් සන්තකයේ දරමින් සිටියදී අත්අඩංගුවට ගත් බවත්, අත්අඩංගුවට ගැනීමෙන් පසුව වගඋත්තරකරුවන් පැමිණිලිකරුට කිසිදු පහරදීමක් සිදු කර නොමැති බවත්, වගඋත්තරකරුවන්ගේ කිසිදු ක්‍රියවකින් පැමිණිලිකරුගේ අයිතිවාසිකම් උල්ලංඝනය වී නොමැති බවත්ය.

පාර්ශව විසින් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති ලේඛන අනුව 2014.07.05 වන දින සෝලමේදී පැය 14.20 ට වගඋත්තරකරුවන් විසින් පැමිණිලිකරුව අත්අඩංගුවට ගෙන ඇති බව නිරීක්ෂණය වන අතර, වගඋත්තරකරුවන්ගේ ප්‍රකාශ අනුව ඔවුන් 2014.07.05 වන දින වනවිට අනුරාධපුර කොට්ඨාශ දූෂණ මර්දන අංශයේ කටයුතු කර ඇති බවත්, කොට්ඨාශ දූෂණ මර්දන අංශය වෙත ලද නිර්නාමික පෙත්සම් අනුව හා එම පෙත්සම්වල සඳහන් තොරතුරුවලට අනුව පුද්ගලික ඔත්තුකරුවෙකු මඟින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර ඇති බවත් නිරීක්ෂණය වේ. වගඋත්තරකරුවන්ගේ උධෘත අනුව මෙම වැටලීමේදී තඹුත්තේගම ප්‍රදේශයේ පැමිණිලිකරු සමඟ පුද්ගලයින් කිහිප දෙනෙකු අත්අඩංගුවට ගෙන ඇති බව නිරීක්ෂණය වන අතර, අත්අඩංගුවට පත් සියලුදෙනාම නීතිවිරෝධී මත්පැන් සන්තකයේ දරමින් සිට ඇති අය බවද නිරීක්ෂණය වේ.

පැමිණිලිකරු දක්වා ඇත්තේ, වගඋත්තරකරුවන් තමන්ව අත්අඩංගුවට ගනු ලැබුවේ නීතිවිරෝධී සන්තකයක් නොතිබියදී තමන් අත්අඩංගුවට ගන්නා අවස්ථාවේදී වගඋත්තරකරුවන්ගේ භාරයේ සිටි කිරිබයියාගේ කරුණාපාල යන අය සාක්ෂි දරන බවය.

කිරිබයියාගේ කරුණාපාල යන අයවද වගඋත්තරකරුවන් නීතිවිරෝධී සන්තකයක් දරමින් සිටියදී 2014.07.05 වන දින අත්අඩංගුවට ගෙන ඇති බව ඉදිරිපත්ව ඇති ලේඛන අනුව නිරීක්ෂණය වන අතර, කිරිබයියාගේ කරුණාපාල යන අය විසින් කොමිසම වෙත ලබා දී ඇති දිවුරුම් ප්‍රකාශය අනුව 2014.07.05 වන දින පැමිණිලිකාර අජිත් විමලසේන යන අයව අත්අඩංගුවට ගෙන ඇති බව නිරීක්ෂණය වේ. අත්අඩංගුවට ගන්නා අවස්ථාවේදී පැමිණිලිකරු සන්තකයේ නීතිවිරෝධී මත්පැන් නොතිබූ බවට කරුණාපාල යන අයගේ සාක්ෂිය මඟින් නිරීක්ෂණය වන්නේ නැත.

ඒ අනුව වගඋත්තරකරුවන් විසින් පැමිණිලිකරුට නීතිවිරෝධී සන්තකයක් නොදරමින් සිටියදී අත්අඩංගුවට ගෙන ඇති බවට කරුණු නිරීක්ෂණය නොවන බැවින් පැමිණිලිකරුගේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ 13(1) හි සඳහන් අයිතිවාසිකම් වගඋත්තරකරුවන්ගේ ක්‍රියාවකින් උල්ලංඝනය වී ඇති බවට නිරීක්ෂණය නොවේ.

පැමිණිලිකාර ජී.අමිල ශ්‍රීකාන්ත යන අය විසින් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති 2014.07.15 දිනැති පැමිණිල්ලෙන් දන්වා ඇත්තේ, පොලිස් නිලධාරී එරංග මහතා ප්‍රමුඛ කණ්ඩායම තම සහෝදරයා වන අජිත් විමලසේන යන අයට පහරදීමක් සිදු කරන ලද බවය.

2015.06.24 වන දින මෙම පැමිණිල්ල සම්බන්ධයෙන් පාර්ශව කැඳවා පරීක්ෂණ සිදුකර ඇති අතර, මෙම පරීක්ෂණය සඳහා පැමිණිලිකරු හා අතෘප්තියට පත් අයද සහභාගී වී ඇත. එහිදී වගඋත්තරකාර පාර්ශවය වෙනුවෙන් පොලිස් පරීක්ෂක රවින්ද්‍ර ජයතිස්ස මහතා පෙනී සිට නැති අතර, ඔහු මෙකී දිනයේ පොලිස් නිලධාරීන්ගේ පුහුණුවකට සහභාගී වී ඇති බව දැනුම් දී ඇත.

නමුත් අදාළ වැටලීමට සහභාගී වූ සෙසු නිලධාරීන් පරීක්ෂණය සඳහා පෙනී සිට නොමැති අතර, අදාළ පරීක්ෂණයේදී අජිත් විමලසේන යන අය ප්‍රකාශ කර ඇත්තේ, ඔහුට පොලිස් පරීක්ෂක රවින්ද්‍ර ජයතිස්ස, පොලිස් කොස්තාපල් 64992 එරංග, පොලිස් කොස්තාපල් 34659 කුමාරසිංහ, පොලිස් කොස්තාපල් 15901 දිසානායක, පොලිස් කොස්තාපල් 53585 රංජන්, පොලිස් කොස්තාපල් 16127 සංඛ යන නිලධාරීන් විසින් පහර දුන් බවය.

පැමිණිලිකරුව 2014.07.05 දින අත්අඩංගුවට ගෙන 2014.07.06 වන දින පෙ.ව.11.50 ට පමණ පොලිස් ඇප ලබා දී ඇති බව නිරීක්ෂණය වන අතර, පැමිණිලිකරුට පැය 11.50 ට පොලිස් ඇප ලබා දීමෙන් පසු 2014.07.06 වන දිනම පැය 13.25 ට පමණ නැවත අත්අඩංගුවට ගෙන ඇති බව නිරීක්ෂණය වේ. මෙම පැමිණිලිකරුව 2014.07.06 දින පැය 13.25ට නැවත අත්අඩංගුවට ගෙන ඇත්තේ, පැමිණිලිකාර අජිත් විමලසේන විසින් කාන්තාවකට සිදුකළ පහරදීමක් හේතුකොට ගෙන 2014.07.02 දින ලද පැමිණිල්ලකට අනුව බවද නිරීක්ෂණය වේ.

2014.07.06 වන දින පැය 13.25 ට පැමිණිලිකරුව නැවත අත්අඩංගුවට ගැනීමෙන් පසු ඔහුගේ ශරීරයේ 'පිටතින් පෙනීමට තුවාල කිසිවක් නැත' යනුවෙන් උප සේවය භාර නිලධාරියා විසින් සටහන් තබා භාරගෙන ඇත. එමෙන්ම 2014.07.06 දින පැය 16.00 ට පොලිස් ඇපමත මුදාහැර ඇති බවද නිරීක්ෂණය වේ.

2014.07.06 වන දින පැය 13.25 ට පැමිණිලිකරුව නැවත අත්අඩංගුවට ගෙන ඇති බව පැමිණිලිකරුගේ හෝ අතෘප්තියට පත් අයගේ පැමිණිල්ල මඟින් දන්වා නැති අතර, 2014.07.07 දින උදේ 8.50 ට පමණ අජිත් විමලසේන ප්‍රතිකාර ලබා ගැනීම සඳහා රෝහල්ගත වී ඇති බව නිරීක්ෂණය වේ.

පැමිණිලිකරුව අත්අඩංගුවට ගෙන ඇත්තේ, 2014.07.05 පැය 14.20 ට වේ. ඒ අනුව ඔහු පොලිස් ඇප ලබා පොලිසියෙන් පැමිණ ඇති බව නිරීක්ෂණය වන අතර, 2014.07.06 දිනම පැය 13.25 ට නැවත කාන්තාවකට පහරදීමක් සම්බන්ධ පැමිණිල්ලක් අනුව අත්අඩංගුවට ගෙන ඇති බව නිරීක්ෂණය වේ.

පැමිණිලිකරුව එදිනම නැවත අත්අඩංගුවට ගෙන උප සේවයට භාර දී ඇති බව උධෘත අනුව නිරීක්ෂණය වන අතර, උප සේවය භාර නිලධාරීන් විසින් පැමිණිලිකරුගේ ශරීරයේ පිටතින් පෙනීමට තුවාල කිසිවක් නැත යනුවෙන් සටහන් යොදා භාරගෙන ඇති බවද එමෙන්ම පැමිණිලිකරුව 2014.07.06 දිනම පැය 16.00 ට පොලිස් ඇපමත මුදාහැර ඇති බවද නිරීක්ෂණය වේ.

පැමිණිලිකරුව මෙලෙස මුදාහැරීමෙන් පසුව 2014.07.07 වන දින පැය 8.50 ට වෛද්‍ය ප්‍රතිකාර ලබා ගැනීම සඳහා රෝහල්ගතව ඇති බව නිරීක්ෂණය වේ.

අධිකරණ වෛද්‍ය වාර්තාව :-

පැමිණිලිකරුට අදාළ අධිකරණ වෛද්‍ය වාර්තාව තඹුත්තේගම රෝහල වෙතින් කැඳවා ඇති අතර, වෛද්‍යවරයාගේ වෛද්‍ය මතය පහත පරිදි සටහන් කර ඇත.

01. 5x3cm horizontally placed contusion over posterior chest below right scapular bone (2cm below lower angle of scapular bone)

02. 4x3cm horizontally placed contusion over right side posterior and lower chest (6cm below lower angle of scapular bone)

03. 4x3cm horizontally placed contusion over left side posterior and lower chest (5cm below lower angle of scapular bone)

04. 4x3cm horizontally placed contusion over left side back of arm (4cm below tip of left shoulder)

05. 3x2cm contusion over left buttock and obliquely positioned.

06. 4x2cm contusion over left posterior thigh and horizontally positioned chest X-ray (4273) Normal
Opinion-Injuries are compatible with given history'

වෛද්‍යවරයාගේ වෛද්‍ය වාර්තාවේ සඳහන් තුවාල රෝගියා විසින් ලබා දී ඇති ඉතිහාසය සමඟ සැසඳෙන බවට වෛද්‍ය මතය සටහන් කර ඇත.

වගඋත්තරකරුවන් පැමිණිලිකරුට පහරදුන්නේය යන චෝදනාව ප්‍රතික්ෂේප කරනු ලබන අතර, ඔවුන් මෙලෙස ප්‍රතික්ෂේප කරමින් කියා සිටින්නේ, 2014.07.05 වන දින අත්අඩංගුවට ගත් පැමිණිලිකරුව 2014.07.06 වන දින පැය 11.50 ට පොලිස් ඇප මත මුදාහරින ලද බවත්, එසේ මුදාහරින ලද පැමිණිලිකරු 2014.07.07 වන දින පැය 8.50 ට රෝහලට ඇතුළත් වී ඇති බවත්, පොලිස් ඇප මත මුදාහරින ලද මෙම පැමිණිලිකරු 2014.07.06 දින පැය 8.50 දක්වා පැය ගණනාවකට පසු රෝහල්ගතව ප්‍රතිකාර ගෙන ඇති බැවින් ඒ සම්බන්ධ රෝග තත්වයන් වගඋත්තරකරුවන්ගේ භාරයේ සිටියදී සිදුවූ රෝග තත්වයන් නොවන බවය.

වගඋත්තරකරුවන් මේ සම්බන්ධයෙන් තවදුරටත් ප්‍රකාශ කර ඇත්තේ, මෙම පැමිණිලිකරුව ඇපමත මුදාහැරීමෙන් පසුව නැවත අත්අඩංගුවට ගැනීමක් සිදුව ඇති බවත්, එම අත්අඩංගුවට ගැනීමෙන් පසු එදින උප සේවය වෙත පැමිණිලිකරු භාරදී ඇති බවත්, මෙම පැමිණිලිකරු භාරගත් උපසේවක නිලධාරීන් විසින් මෙම පැමිණිලිකරුව භාරගෙන පරීක්ෂා කළ බවත්, මතුපිටින් පෙනෙන තුවාල කිසිවක් දක්නට නැති බව තොරතුරු සටහන්වල යොදා ඇති බවත්, ඒ අනුව පැමිණිලිකරුට අදාළ වෛද්‍ය වාර්තාවේ සඳහන් තුවාල වගඋත්තරකරුවන්ට අදාළ නොවන බවත්ය.

පැමිණිලිකරු තම පැමිණිල්ල මඟින් ප්‍රකාශ කර ඇත්තේ, මෙම පැමිණිල්ලේ සඳහන් ඉහත වගඋත්තරකරුවන් ඔහුට පහර දුන් බවය. එමෙන්ම අධිකරණ වෛද්‍ය නිලධාරී විසින් රෝගියා පරීක්ෂා කරන අවස්ථාවේ පොලිස් නිලධාරීන් කණ්ඩායමක් පහරදුන් බව ප්‍රකාශ කර ඇත. රෝගියාගේ ප්‍රකාශය සමඟ රෝග සැසඳෙන බවද අධිකරණ වෛද්‍ය නිලධාරියාගේ මතය ලබා දී ඇත.

පැමිණිලිකරුගේ පැමිණිල්ල, වෛද්‍යවරයාගේ වෛද්‍ය වාර්තාව, වෛද්‍ය මතය අනුව පැමිණිලිකරුගේ ශරීරයේ පැවති තුවාල සැසඳෙන බවට පවතින තොරතුරු පදනම්ව පැමිණිලිකරුට වගඋත්තරකරුවන්ගේ ක්‍රියාවන් හේතුවෙන් වධහිංසාවකට ලක් වූයේය යන නිගමනයකට එළඹීමට කරුණු පවතියි.

වගඋත්තරකරුවන් විසින් අත්අඩංගුවට ගෙන ඇපමත මුදාහරින ලද පැමිණිලිකරුව නැවත අත්අඩංගුවට පත්ව උපසේවයට භාරදෙන අවස්ථාවේදී ඔහුගේ ශරීරයේ මතුපිටින් පෙනෙන තුවාල කිසිවක් නොමැති බවට උප සේවකගේ සටහන් පිළිබඳව වගඋත්තරකරුවන් විසින් කරනු ලබන තර්කය හා පැමිණිලිකරු පොලිස් ඇපමත මුදාහැරීමෙන් පසුව පැය 24කට ආසන්න කාලයක් ප්‍රතිකාර ලබා ගැනීම සඳහා රෝහල්ගත නොවී සිටීම පිළිබඳව වගඋත්තරකරුවන් තර්කයන් ඉදිරිපත් කර තිබුණද පැමිණිලිකරුගේ ශරීරයේ පවතින තුවාල සම්බන්ධයෙන් වෛද්‍ය මතය අනුව සැසඳීමක් පවතින බැවින් වගඋත්තරකරුවන්ගේ තර්කය බැහැර කිරීමට සිදුවේ.

**නිගමනය :-**

ඒ අනුව පැමිණිලිකරුගේ පැමිණිල්ල, පැමිණිලිකරු සම්බන්ධයෙන් ඉදිරිපත්ව ඇති අධිකරණ වෛද්‍ය වාර්තාව, අධිකරණ වෛද්‍ය නිලධාරීන්ගේ වෛද්‍ය මතය යන සියලු කරුණු සලකා බැලීමේදී වගඋත්තරකරුවන්ගේ ක්‍රියාවන් හේතුවෙන් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ 11 වන ව්‍යවස්ථාවෙහි සඳහන් පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම උල්ලංඝනය වී ඇති බවට මානව හිමිකම් කොමිෂන් සභාව මෙයින් නිගමනය කරනු ලැබේ.

**නිර්දේශය :-**

ඒ අනුව, 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ 11 වන ව්‍යවස්ථාවෙහි සඳහන් පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම උල්ලංඝනය වී ඇති බැවින්, වගඋත්තරකාර පොලිස් පරීක්ෂක

රවීන්ද්‍ර ජයතිස්ස, පොලිස් කොස්තාපල් 64992 එරංග, පොලිස් කොස්තාපල් 34659 කුමාරසිංහ, පොලිස් කොස්තාපල් 15901 දිසානායක, පොලිස් කොස්තාපල් 53585 රංජන් සහ පොලිස් කොස්තාපල් 16127 සංඛ යන පොලිස් නිලධාරීන් සම්බන්ධයෙන් විනය පියවර ගැනීම සඳහා මෙහි පිටපතක් පොලිස්පතිවරයා වෙත හා නීතිපතිවරයා වෙත යොමුකරනු ලැබේ.

2023. 01. 23 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7) වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

A. Shanmuganathan

අනුසූයා ෂන්මුගනාදන්,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

Ms. Anusuya Shanmuganathan
Commissioner
Human Rights Commissioner of Sri Lanka

මා.හේ. නිමල් කරුණාසිරි,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Dr. M.H. Nimal Karunasiri
Commissioner
Human Rights Commission of Sri Lanka

පිටපත :- 01. අමාත්‍යතුමා,
මහජන ආරක්ෂක අමාත්‍යාංශය,
14 වන මහල, සුහුරුපාය, බත්තරමුල්ල.

02. පොලිස්පතිතුමා,
පොලිස් මූලස්ථානය, කොළඹ 01.

02. නීතිපතිතුමා,
නීතිපති දෙපාර්තමේන්තුව, අලුත්කඩේ, කොළඹ 12.

04. මා.හි.කො.ස ප්‍රාදේශීය කාර්යාලය,
අනුරාධපුර.

B/